NEW

# 2566 - මූලික පිරිවෙන් වාර අවසාන විභාගය - 2022 ජූලි

(නව නිර්දේශය)

| 08 | S | I, II |
|---|---|---|

පැ තුනයි

## සමාජ විද්‍යාව - 04 ශ්‍රේණිය

## Sociology Grade 04

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්
පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- අංක 01-40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

1) සමාජ විද්‍යාව විෂයයේ ඓතිහාසික පරිණාමය වසර.

(1) 130 පමණ වේ. (2) 150 පමණ වේ.

(3) 120 පමණ වේ. (4) 190 පමණ වේ.

2) වර්තමානය වන විට සමාජීය විද්‍යා විෂයන් අතර ජනප්‍රියතම විෂයක් බවට සමාජ විද්‍යාව විෂය පත්ව තිබේ.ඊට ප්‍රධාන හේතුව,

(1) මූලික පිරිවෙන් විෂය මාලාවට ඇතුළත් ව තිබීමෙනි.
(2) විශ්වවිද්‍යාල සිසුන් තුළ ජනප්‍රිය විෂයයක් බවට පත්ව තිබීමෙනි.
(3) සමාජ විද්‍යාව විෂය ඉගෙනීමට අවශ්‍ය සම්පත් බහුලව තිබීමෙනි.
(4) සමාජ විද්‍යාව තුළ ව්‍යවහාරික භාවිතයක් අන්තර්ගතව තිබීමෙනි.

3) "සමාජ විද්‍යාවේ රැජින සමාජ විද්‍යාවයි".ලෙස අදහස් දැක්වූයේ,

(1) රැල්ෆ් ලින්ටන් ය. (2) එමිල් ඩුර්ක්හයිම් ය.
(3) ඔගස්ට් කොම්ට් ය. (4) එල්.ටී.හොබ්හවුස් ය.

4) සමාජ විද්‍යාඥයාගේ අධ්‍යයනයට බඳුන් වන සමාජ විද්‍යාවේ ප්‍රධාන විෂය ධාරාව කුමක්ද?

(1) සමාජයයි. (2) පුද්ගලයායි.

(3) මානව පවුලයි. (4) සමාජ වෙනස් වීමයි.

5) දේශපාලන ප්‍රතිසංස්කරණවලට ප්‍රබල සාධකයක් වූ ප්‍රංශ විප්ලවය ආරම්භ වූයේ,

(1) 1689 දීය. (2) 1789 දීය.

(3) 1889 දීය. (4) 1989 දීය.



www.pirivena.lk

6) සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් වන ගෘහාශ්‍රිතව පැවැති නිෂ්පාදන කර්මාන්ත බිඳ වැටීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ සාධකය වන්නේ,

(1) ගෘහාශ්‍රිත නිෂ්පාදන ගුණාත්මක බවින් අඩු වීමෙනි.
(2) ගෘහාශ්‍රිත නිෂ්පාදනවලට වෙළෙඳපොළ වටිනාකම අඩු වීමෙනි.
(3) නිෂ්පාදන ක්‍රියාවලියට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමෙනි.
(4) ගෘහාශ්‍රිත නිෂ්පාදනවලට පිරිවැය අඩු වීමෙනි.

7) ආගමික වශයෙන් මිනිසා නිදහස ලබා ගැනීමේ දී එහි පිබිදීම කෙරෙහි මූලිකව ක්‍රියා කළේ,

(1) 13 හා 14 වන සියවස්වලය. (2) 14 හා 15 වන සියවස්වලය.
(3) 15 හා 16 වන සියවස්වලය. (4) 16 හා 17 වන සියවස්වලය.

8) යුරෝපා සමාජය ධනවාදී සිතුවිලිවලින් සංවර්ධනය කළේ,

(1) බුදුන් වහන්සේගේ දර්ශනය තුළිනි.

(2) රෙපරමාදු හා ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික අදහස් තුළිනි.

(3) ආහාර අර්බුදයට විසඳුම් හා යෝජනා ඉදිරිපත් වීම තුළිනි.

(4) ධනය ඉපයීම විනෝදාංශයක් බවට පත් වීම තුළිනි.

9) 'ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ හරය' කෘතිය රචනා කළේ,

(1) හර්බට් ස්පෙන්සර් ය. (2) මැක්ස් වේබර් ය.
(3) කාල් මාක්ස් ය. (4) නන්දසේන රත්නපාල ය.

10) සමාජ ප්‍රශ්න වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා ඉතාම වැදගත් විෂය ධාරාව නම්,

(1) රසායන විද්‍යාවයි. (2) ජීව විද්‍යාවයි. (3) භෞතික විද්‍යාවයි. (4) සමාජ විද්‍යාවයි.

11) සමාජ ගැටලු ඇතිවීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කරන සාධකය ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) දිළිඳු බව. (2) නූගත් බව.
(3) මධ්‍යසාර ලෝලී බව. (4) සංවිධානකාරී බව.

❖ ප්‍රශ්න අංක 12-14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන විෂයධාරාවන් උපයෝගී කරගන්න.

A - රසායනික විද්‍යාව. B - සමාජ විද්‍යාව.
C - පරිසර විද්‍යාව. D - ස්වභාවික විද්‍යාව.
E - දේශපාලන සමාජ විද්‍යාව. F - මනෝ විද්‍යාව.

12) ඉහත දැක්වෙන විෂය කාණ්ඩ අතරින් විද්‍යා විෂයයන් පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) A,B හා C ය. (2) A,B හා D ය. (3) B,C හා E ය. (4) A,C හා D ය.

13) මානව සමාජය වඩාත් හොඳින් අධ්‍යයනය කළ හැකි සමාජීය විද්‍යා විෂය කාණ්ඩය ඇතුලත් වරණය කුමක්ද?

(1) A,B හා C ය. (2) B,C හා D ය. (3) C,D හා E ය. (4) B,D හා E ය.

14) සමාජීය විද්‍යා විෂය ධාරාවට අයත් උප විෂය ක්ෂේත්‍රයක් දැක්වෙනුයේ,

(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.


www.pirivena.lk

15) සමාජ විද්‍යාත්මක වශයෙන් ඉතා ඉහල අගයක් ඇති යහපත් අන්තර් සබඳතා සමාජ සංවර්ධනයට හේතුවන බව ප්‍රකාශිත සූත්‍ර දේශනාව කුමක්ද?

(1) සිඟාලෝවාද සූත්‍රය. (2) අග්ගඤ්ඤ සූත්‍රය. (3) කාලාම සූත්‍රය. (4) මංගල සූත්‍රය.

16) යහපත් සමාජ ප්‍රගතියක් ගොඩනගා ගැනීම උදෙසා බුදු දහම අගය කරනුයේ,

(1) සතර අගතියෙන් යුක්ත වීමයි. (2) සතර පාරාජිකාවෙන් යුක්ත වීමයි.

(3) ස්වයංපාලනයෙන් යුක්ත වීමයි. (4) ප්‍රිය වචනයෙන් යුක්ත වීමයි.

17) සමාජ විද්‍යාඥයාගේ අවධානයට බඳුන් වන සමාජානුයෝජන සංකල්පය ඉතා ගැඹුරින් විග්‍රහ කරන බෞද්ධ ජාතක දේශනාව කුමක්ද?

(1) වෙස්සන්තර ජාතකය. (2) චුල්ල හංස ජාතකය.

(3) ගුණ ජාතකය. (4) සත්තිගුම්බ ජාතකය.

18) ලොව පහළ වූ අග්‍රගණ්‍ය සමාජ විද්‍යාඥයා වන බුදුන් වහන්සේ භාරතයේ පහළ වූයේ,

(1) ක්‍රි.පූ 03 වන සියවසේදීය. (2) ක්‍රි.ව 03 වන සියවසේදීය.

(3) ක්‍රි.ව 06 වන සියවසේදීය. (4) ක්‍රි.පූ 06 වන සියවසේදීය

19) සමාජ ගතිකත්වය,

(1) භූගෝල විද්‍යාවේ අධ්‍යනය කරන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි.

(2) ජීව විද්‍යාවේ අධ්‍යයනය කරන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි.

(3) සමාජ විද්‍යාවේ අධ්‍යයනය කරන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි.

(4) රසායන විද්‍යාවේ අධ්‍යයනය කරන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි.

20) 'පෞරාණික සමාජ සමාජයෙන් ක්‍රම ක්‍රමයෙන් අතුරුදන් වෙමින් පවතී.' මේ සඳහා බලපාන ප්‍රබල සාධකයක් නම්,

(1) සමාජ ගතිකත්වය හේතුවෙනි. (2) සමාජය පිරිහීම

(3) පැරණි සමාජ අතුරුදහන් වීම හේතුවෙනි. (4) සමාජ විද්‍යාඥයින් සමාජ වර්ග කිරීම හේතුවෙනි.

21) සම්භාව්‍ය සමාජ විද්‍යාව වර්ධනය සඳහා පුරෝගාමීව ක්‍රියා කළේ,

(1) මැක්ස් වෙබර් ය. (2) හර්බට් ස්පෙන්සර් ය.

(3) එමිල් ඩුර්කයිම් ය. (4) ඔගස්ට් කොම්ට් ය.

❖ ප්‍රශ්න අංක 22-23 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් උපයෝගී කරගන්න.

A - ඔගස්ට් කොම්ට්. B - එමිල් ඩුර්ක්හයිම්.

C - හර්බට් ස්පෙන්සර්. D - මැක්ස් වෙබර්.

22) ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයින් ඇතුළත් නිවැරැදි වරණය තෝරන්න.

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා C ය.

23) 'යථානුභූත දර්ශනය' කෘතිය රචනා කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.



www.pirivena.lk

❖ ප්‍රශ්න අංක 24-25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සමාජ විද්‍යාඥයින්ගේ අදහස් උපයෝගී කරගන්න.

A - සියල්ල දේව නිර්මාණයක් වීම. B - ශ්‍රම විභජනයක් පැවතීම.
C - ඒකාධිපති පාලකයකු සිටීම. D - පන්ති විරහිත සමාජයක් පැවතීම.

24) කාල් මාක්ස් ඉදිරිපත් කළ අදහස දැක්වෙන වරණය කුමක්ද?
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

25) එමිල් ඩුර්කයිම් විසින් ඉදිරිපත් කළ අදහස ඇතුළත් පිළිතුර වන්නේ,
(1) A ය. (2) B ය. (3)C ය. (4) D ය.

26) සමාජ පරිණාමය විග්‍රහ කිරීමේදී ආර්ථික සාධකය මුල්කරගත් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා නම්,
(1) මැක්ස් වේබර් ය. (2) රැල්ෆ් ලින්ටන් ය.
(3) ඊ.බී ටයිලර් ය. (4) කාල් මාක්ස් ය.

27) කාල් මාක්ස් විසින් ඉදිරිපත් කළ සමාජ පරිණාමය ඇතුළත් වරණය කුමක්ද?

(1) ප්‍රාග් කොමියුනිස්ට්,සමාජවාදී,වහල් වැඩවසම්,ධනවාදී යුග වශයෙනි.

(2) ප්‍රාග් කොමියුනිස්ට්,වහල් වැඩවසම්,ධනවාදී,සමාජවාදී යුග වශයෙනි.

(3) ප්‍රාග් කොමියුනිස්ට්,වැඩවසම්,වහල් ධනවාදී,සමාජවාදී යුග වශයෙනි.

(4) පූර්ව කොමියුනිස්ට්,වහල් ධනවාදී,වැඩවසම්,සමාජවාදී යුග වශයෙනි.

28) පැරණි සමාජ පරිණාමය වීම කෙරෙහි බලපෑ ප්‍රබල සාධකය ලෙස හඳුනාගත හැකි වන්නේ,

(1) වෙනස්වන සමාජයට අනුව මිනිසුන් වෙනස් වීමයි.

(2) සමාජ විසංවිධානය වීමයි.

(3) නව සොයාගැනීම් වේගවත් වීමයි.

(4) ග්‍රාමීය සමාජ නාගරීකරණය වීමයි.

29) නැකත,කයිය,පංගුව වැනි සංකල්ප වල සමාජ විද්‍යාත්මක වැදගත්කම වන්නේ,
(1) නූතන සමාජය තුළ ගොඩනැගුණු අන්තර් සබඳතා නිරූපිතයයි.
(2) ප්‍රාථමික සමාජ ආර්ථික ක්‍රියාවලිය හා බැඳුණු අන්තර් ක්‍රියා නිරූපිතයයි.
(3) ජ්‍යොතිශය හා බැඳුණු ආර්ථික ක්‍රියාවලිය නිරූපිතයයි.
(4) අන්තර් ආගමික සම්බාධක නිරූපිතයයි.

30) කාර්මීකරණයේ ප්‍රථම පියවර ලෙස වාෂ්ප බලයෙන් ක්‍රියා කරවන යන්ත්‍රයක් නිපදවීමේ ප්‍රමුඛතමයා,

(1) තෝමස් අල්වා එඩිසන් ය. (2) ජේම්ස් වොට්ය.
(3) හර්බට් මීඩ් ය. (4) ජේම්ස් විලියම්සන් ය.

31) සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් සිදුවීමක් වූ ප්‍රංශ වැඩවසම් රාජ්‍ය පාලන ක්‍රමය බිඳ වැටීමට ලක් වූයේ,
(1) 1779 දී. (2) 1789 දී. (3) 1979 දී. (4) 1978 දී.


www.pirivena.lk

31) සමාජ ප්‍රභවය,විකාශනය,දියුණුව,පරිහානිය පිළිබඳව ඉතා කදිමව විස්තර කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව නම්,

(1) තිරෝකුඩ්ඩ සූත්‍රයයි. (2) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(3) චක්කවත්තිසීහනාද සූත්‍රයයි. (4) කසීභාරද්වාජ සූත්‍රයයි.

33) චක්කවත්ති සීහනාද සූත්‍රය මගින් හෙළි කරන සමාජ විද්‍යාත්මක වැදගත්කම වන්නේ,

(1) ස්වයං පාලනයයි. (2) අන්තර් සමාජ සබඳතාවයි.
(3) රාජ්‍යය පාලන මූලධර්මයයි. (4) සමාජ ප්‍රභවයයි.

34) සමාජ විද්‍යාව තුළ අධ්‍යයනය කරන සාධිත තත්ත්ව සංකල්පයට අයත් නොවන වරණය තෝරන්න.

(1) පූජකයෙකු වීම. (2) මව් පදවිය ලැබීම. (3) ගොවියෙකු වීම. (4) කුලය.

35) යුරෝපා සමාජය තුළ ආගමික පිබිදීම ප්‍රභවය සිදුවූයේ,

(1) 14 හා 15 වන සියවස්වලය. (2) 16 හා 17 වන සියවස්වලය.

(3) 17 හා 18 වන සියවස්වලය. (4) 18 හා 19 වන සියවස්වලය.

36) සමාජ අන්තර් සම්බන්ධතා ධනාත්මක සංවර්ධනයකට මග පෙන්වන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) චක්කවත්තිසීහනාද සූත්‍රය. (2) මංගල සූත්‍රය.

(3) සිඟාලෝවාද සූත්‍රය. (4) කාලාම සූත්‍රය.

37) ලාංකේය සමාජය තුළ දක්නට ලැබෙන උප සංස්කෘතියක් වන්නේ,

(1) බෞද්ධ සංස්කෘතියයි. (2) හින්දු සංස්කෘතියයි.

(3) ඉස්ලාම් සංස්කෘතියයි. (4) ආදිවාසී සංස්කෘතියයි.

38) සමාජ විද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන කාන්තාවට සමාජයේ කිසිදු වරප්‍රසාදයක් ලබා නොදී ක්‍රියා කළේ,

(1) හින්දු ආගම තුළය. (2) ජෛන ආගම තුළය.

(3) බ්‍රාහ්මණ ආගම තුළය. (4) ඉස්ලාම් ආගම තුළය.

39) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පුරෝගාමියා වශයෙන් විරුදාවලිය ලැබුවේ කවුද?

(1) ඔගස්ට් කොම්ට්. (2) සෙන්ට් සිමෝන්. (3) සිසාරෝ ලොම්බ්‍රෝසෝ. (4) ඊ.බී ටයිලර්.

40) කතරගම,ගම්පොළ අම්බුළුවාව යන ආගමික සිද්ධස්ථාන වල සමාජ විද්‍යාත්මක වටිනාකම වන්නේ,

(1) දෙවියන් වැඩ සිටින ස්ථාන වේ.

(2) ලංකාවේ ප්‍රධාන නගර දෙකක් වේ.

(3) හින්දු බැතිමතුන් පුද පූජා පවත්වන ආගමික සිද්ධස්ථාන වේ.

(4) බහු ආගමික පුදබිම් වේ.

* * *



www.pirivena.lk

# 2566 - මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2022 ජූලි

| 08 | S | I, II |
|---|---|---|

## 04 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1)

(i) විද්‍යාත්මක විධික්‍රම අනුව යමින් විවිධ විෂයයන් බෙදිය හැකි ප්‍රධාන අංශ දෙක නම් කරන්න.

(ii) ඔබ දන්නා ස්වභාවික විද්‍යා විෂයන් දෙකක් නම් කරන්න.

(iii) සමාජ විද්‍යාවේ ප්‍රධාන අරමුණු දෙකක් සඳහන් කරන්න.

(iv) එමිල් ඩුර්කයිම් විසින් රචිත කෘති දෙකක් නම් කරන්න.

(v) ලාංකීය සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන ජන වර්ග දෙකක් නම් කරන්න.

(vi) සමාජීය විද්‍යා විෂය ධාරාව හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(vii) යහපත් සමාජ පැවැත්ම උදෙසා සමාජ සාරධර්ම අන්තර්ගත බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

(viii) ඔගස්ට් කොම්ට් විසින් පෙන්වා දුන් දේවවාදී අවධිය තුළ සමාජයේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(ix) කාල් මාක්ස්ට අනුව සමාජය තුළ පන්ති විරහිත තත්ත්වයක් විග්‍රහ කරන සමාජ අවධි දෙක නම් කරන්න.

(x) කොරෝනා (covid 19) රෝගයෙන් ආරක්ෂා වීම සඳහා ඔබ විසින් අනුගමනය කරණ ඉතා වැදගත් පියවරයන් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 x 10 = 20 යි.)

2)

(i) ඔබ සමාජ විද්‍යාව විෂය හඳුනා ගත් අයුරු නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)

(ii) සමාජ විද්‍යාව විෂය බිහිවීම උදෙසා බලපෑ ප්‍රධාන සාධක තුන නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) සමාජ විද්‍යාඥයා විසින් අධ්‍යයනය කරන ප්‍රධාන ක්ෂේත්‍රයන් දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

3)

(i) එමිල් ඩුර්කයිම් සමාජ විද්‍යාව විෂය නිර්වචනය කළේ කෙසේද? (ලකුණු 02 යි.)

(ii) ආගමික ප්‍රතිසංස්කරණ හේතුවෙන් සමාජය තුළ ඇති වූ වැදගත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) ගෘහාශ්‍රිතව පැවති කර්මාන්ත බිඳ වැටීමට බලපෑ ප්‍රධාන සාධක දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)



www.pirivena.lk

4)

(i) සමාජ මනෝ විද්‍යාව තුලින් අධ්‍යයනය කරන ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) වර්තමාන ලාංකීය සමාජය තුළ උද්ගතව ඇති සමාජ ප්‍රශ්න තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) පංචශීල ප්‍රතිපදාව සමාජ ප්‍රශ්න අවම කිරීමට හේතු වන බව කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න . (ලකුණු 05 යි.)

5)

(i) සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන් විසින් දෙමාපියන් කෙරෙහි දැක්විය යුතු යුතුකම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) පුද්ගලයා සමාජානුයෝජනයට හසුවන කාරකයන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) දුස්සමාජානුයෝජනය සමාජය කෙරෙහි බලපාන ආකාරය ප්‍රධාන අංශ දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න.. (ලකුණු 05 යි.)

6)

(i) හර්බට් ස්පෙන්සර්ගේ සමාජ වර්ග ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) මැක්ස් වේබර් ට අනුව ආධිපත්‍යයේ ප්‍රධාන අංශ තුන නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) පැරණි හා නූතන සමාජ ලක්ෂණ දෙකක් ඔස්සේ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

7)

(i) සමාජ වෙනස්වීම අධ්‍යයනය කිරීමේදී සමාජ විද්‍යාඥයන්ට අනුව සමාජ සංවර්ධනයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) සමාජ ගතිකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) දේශපාලන ප්‍රතිසංස්කරණ (ප්‍රංශ ආණ්ඩුක්‍රම විප්ලවය) හේතුවෙන් සමාජය තුළ ගොඩනැගුණු නවමු ලක්ෂණ දෙකක් ඔස්සේ කරුණු දක්වන්න. (ලකුණු 05 යි.)

8)

(i) පුද්ගල දියුණුව බුදු දහමේ විග්‍රහ කරන ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) සමාජ පරිණාමයේ දී නාගරීකරණය තුළ හඳුනාගත හැකි කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) පුද්ගල දියුණුවට හේතුවන ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

* * *



www.pirivena.lk

NEW

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

| 08 | S | I, II |
|---|---|---|

(නව නිර්දේශය)

පැ තුනයි

## 04 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

(ලකුණු 01×40=40 යි)

(1) සමාජ විද්‍යාව විෂය බිහිවීම කෙරෙහි ප්‍රබල ලෙසම බලපෑම් කළ සමාජ පසුබිම ගොඩනැගුනේ,

(1) ආසියාතික සමාජ තුළයි. (2) අප්‍රිකානු සමාජ තුළයි.

(3) ලතින් ඇමරිකානු සමාජ තුළයි. (4) බටහිර සමාජ තුළයි.

(2) සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් සමාජගත වූයේ,

(1) ක්‍රි.ව 1838 වර්ෂයේ දී ය. (2) ක්‍රි.ව 1883 වර්ෂයේ දී ය.

(3) ක්‍රි.ව 1938 වර්ෂයේ දී ය. (4) ක්‍රි.ව 1983 වර්ෂයේ දී ය.

(3) යුරෝපා සමාජයේ ආගමික පිබිදීමක් ඇතිවීම කෙරෙහි ප්‍රබල ලෙස බලපෑම් කළ "ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික නිකාය" හඳුන්වාදීමේ පුරෝගාමියා වූයේ,

(1) ජෝන් කැල්වින් ය. (2) ජෝන් ලොග් ය. (3) මාටින් ලූතර් ය. (4) මාටින් ලූතර් කිං ය.

* පහත සඳහන් කෘතීන් සැලකිල්ලට ගෙන ප්‍රශ්න අංක 04-05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(A) යථානුභූත දර්ශනය.** **(B) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන්.**

**(C) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ හරය.** **(D) ආත්ම ඝාතනය.**

(4) එමිල් ඩූර්කයිම් විසින් රචිත කෘතීන් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) B හා D ය.

(5) ධනවාදී ආකල්ප බටහිර සමාජයන් තුළ ගොඩනැගුණු ආකාරය අන්තර්ගත කරමින් කරුණු විස්තර කරනුයේ,

(1) A කෘතිය මඟිනි. (2) B කෘතිය මඟිනි. (3) C කෘතිය මඟිනි. (4) D කෘතිය මඟිනි.

www.pirivena.lk

[2 වැනි පිටුව බලන්න.

(6) මාටින් ලූතර් හා ජෝන් කැල්වින් යන පූජකවරු සමාජ විද්‍යාව විෂය සම්බන්ධයෙන් වැදගත් වන්නේ,

(1) දේශපාලන ප්‍රතිසංස්කරණ සිදුකිරීම හේතුවෙනි.

(2) කාර්මික නිෂ්පාදන නිර්මාණය කිරීම හේතුවෙනි.

(3) ආගමික ප්‍රතිසංස්කරණ සඳහා පුරෝගාමී වීම හේතුවෙනි.

(4) කිතුණු ආගමිකයින් වීම හේතුවෙනි.

(7) සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත්වන දේශපාලන ප්‍රතිසංස්කරණ ආරම්භ වීම කෙරෙහි බලපෑම් කළ ආසන්නතම සාධකය නම්,

(1) දහතුන්වන ලූවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.

(2) පහළොස්වන ලූවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.

(3) දහසයවන ලූවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.

(4) දහඅටවන ලූවී රජුගේ පාලනයට එරෙහිව කැරලි ගැසීමයි.

(8) සමාජ විද්‍යාඥයාගේ විෂය පථය තුළ ප්‍රමුඛතාව හිමිවන්නේ,

(1) සමාජ ලෝකය අධ්‍යනය කිරීමටයි. (2) සමාජ ප්‍රශ්න අධ්‍යනය කිරීමටයි.

(3) සමාජ පර්යාය අධ්‍යනය කිරීමටයි. (4) සමාජ පාලනය අධ්‍යනය කිරීමටයි.

(9) සමාජ විද්‍යාඥයින්ගේ ඉගැන්වීම්වලට අනුව මානව සමාජයක් යන සංකල්පය වඩාත් හොඳින් නිරූපණය වන්නේ.

(1) ගුවන් යානාවක ගමන් ගන්නා මගීන් පිරිසක් ය.

(2) පාංශුකුල කටයුතු සිදුකරන පිරිසක් ය.

(3) පන්සලක වැඩවාසය කරන ස්වාමින් වහන්සේ නමක් ය.

(4) රූපවාහිනී යන්ත්‍රයක් නරඹන පාසල් සිසුවෙක් ය.

(10) " මානව පරිසරය මිනිසා හා ඒ සියල්ල අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාව හදාරණ විෂය සමාජ විද්‍යාවයි."
මෙම ප්‍රකාශය හා වඩාත් සැසඳෙන වරණය කුමක්ද?

(1) එලිසබෙත් ජේ.විල්කින්ස් ය. (2) එල්.ටී හොබ්හවුස් ය. (3) එම්.ජී ෆෙයාචයිල්ඩ් ය. (4) ජෝන් ස්ටුවට් මිල් ය.

* ප්‍රශ්න අංක 11-12 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සමාජ විද්‍යාඥයින්ගේ ඇසුර ලබාගන්න.

**(A) එමිල් ඩූර්කයිම්.** **(B) ඊ.බී ටයිලර්.**

**(C) කාල් මාක්ස්.** **(D) රැල්ෆ් ලින්ටන්.**

(11) සමාජ පරිණාමය පිළිබඳව අදහස් ඉදිරිපත් කළ මුල්කාලීන සමාජ විද්‍යාඥයින් ඇතුළත් වරණය කුමක්ද?

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

(12) ආර්ථික සාධකය ප්‍රමුඛකර ගනිමින් අවධි පහක් ඔස්සේ සමාජ විකාශනය පිළිබඳව අදහස් ඉදිරිපත් කළේ කවුද?

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(13) සමාජ වර්ග දෙකක පවතින ලක්ෂණ සමාජ විද්‍යාත්මකව එමිල් ඩූර්කයිම් විස්තර සපයන කෘතිය නම්,

(1) සියදිවි නසා ගැනීම ය. (2) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන් ය.

(3) ආගමික ජීවිතයේ මූලික හරය ය. (4) සමාජයේ ශ්‍රම විභජනය ය.

www.pirivena.lk

(14) ප්‍රංශයේ පැවති වැඩවසම් සමාජ ක්‍රමය බිඳවැටී ලිබරල්වාදී පාලන ක්‍රමයක් බිහි වූයේ,

(1) 1689 දී ය. (2) 1789 දී ය. (3) 1889 දී ය. (4) 1989 දී ය.

(15) සමාජ විද්‍යාත්මක වශයෙන් වැදගත් වන ප්‍රබල සාධකයක් වූ එංගලන්තය මූලික කරගෙන ආරම්භ වූ නව සොයාගැනීම් හා නිපදවීම් ඇති වූයේ,

(1) 14 හා 15 වන සියවස්වලය. (2) 15 හා 16 වන සියවස්වලය.

(3) 16 හා 17 වන සියවස්වලය. (4) 18 හා 19 වන සියවස්වලය.

(16) ආර්ථික සාධකය පමණක් ප්‍රමුඛ කර ගනිමින් සමාජ පරිණාමය ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා නම්,

(1) රැල්ෆ් ලින්ටන් ය. (2) කාල් මාක්ස් ය.

(3) ඔගස්ට් කොම්ට් ය. (4) හර්බට් ස්පෙන්සර් ය.

(17) ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාව මත හොඳ හෝ නරක පුද්ගලයෙකු බවට පත් වන බව විස්තර කරන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) කාලාම සූත්‍රය. (2) කුටදන්ත සූත්‍රය. (3) අස්සලායන සූත්‍රය. (4) වසල සූත්‍රය.

(18) පුද්ගලාන්තර සබඳතා ගොඩනගා ගතයුතු ආකාරය අර්ථාන්විතව දේශිත බෞද්ධ සූත්‍ර දේශනාව නම්,

(1) සිගාලෝවාද සූත්‍රයයි. (2) පරිනිබ්බාන සූත්‍රයයි.

(3) පරාභව සූත්‍රයයි. (4) දම්සක් පැවතුම් සූත්‍රයයි.

(19) සෑම මිනිසෙකුම හැකිතාක් ධනය උත්පාදනය කර ඒ දෙස බලා සිටින දෙවියන් වහන්සේ සතුටු කළ යුතු බව,

(1) මැක්ස් වේබර්ගේ අදහසයි. (2) කාල් මාක්ස්ගේ අදහසයි.

(3) ෆෙඩ්රික් එංගල්ස්ගේ අදහසයි. (4) ජෝන් කැල්වින් හා මාටින් ලූතර්ගේ අදහසයි.

(20) සමාජ ප්‍රභවය, විකාශනය, දියුණුව හා පිරිහීම, රාජ්‍ය බිහිවීම, සමාජ බේදීම ආදී අවස්ථා පිළිබඳව ඉතා කදිමව විස්තර සපයන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය. (2) සාමඤ්ඤඵල සූත්‍රය. (3) අරිය පර්යේෂණ සූත්‍රය. (4) අග්ගඤ්ඤ සූත්‍රය.

(21) පහත දැක්වෙන සමාජයන් අතරින් උප සංස්කෘතියකට අයත් නොවන්නේ,

(1) ඉස්ලාම් සමාජය. (2) ආදිවාසී සමාජය. (3) නිට්ටෑවන්ගේ සමාජය. (4) අභිකුණ්ඨික සමාජය.

(22) සමාජ විද්‍යාව තුළ අධ්‍යනයට බඳුන් වන සංස්කෘතිය තුළ අභෞතික සංස්කෘතියට අයත් නොවන්නේ,

(1) සිරිත් විරිත්. (2) කුට්ටම් පොකුණ. (3) විශ්වාස. (4) ධර්මතා.

(23) කිසියම් සංස්කෘතියක ආධිපත්‍යට බලවත් සංස්කෘතියේ ලක්‍ෂණ ව්‍යාප්තවීම සමාජ විද්‍යාව තුළ හඳුන්වන්නේ,

(1) සංස්කෘතික ව්‍යාප්තිය වශයෙනි. (2) සංස්කෘතික පරිණාමය වශයෙනි.

(3) සංස්කෘතික සම්පර්කය වශයෙනි. (4) සංස්කෘතික ගැටුම වශයෙනි.

(24) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ ප්‍රමුඛතමයා ලෙස අගය කරනුයේ,

(1) ඔගස්ට් කොම්ට් ය. (2) රේමන්ඩ් ෆර්ත් ය. (3) ඇල්බට් කොහෙන් ය. (4) ඊ.බී ටයිලර් ය.

(25) දරුවෙකු උපත ලැබීමට පෙර සිටම කායිකව හා මානසිකව කළල අවධියේදීම මවු කුස තුළදී පෝෂණය වන බව විවරණය කරන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) ඉන්දික සූත්‍රයයි. (2) කාලාම සූත්‍රයයි.

(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) කසීභාරද්වාජ සූත්‍රයයි.

www.pirivena.lk

[4 වැනි පිටුව බලන්න.

* පහත සඳහන් කරුණු අධ්‍යනය කර ප්‍රශ්න අංක 26-28 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**(A) සොරකම් නොකිරිම.** **(B) අසල්වැසියන්ට ප්‍රේම කිරීම.**

**(C) වැරදි කාම සේවනයෙන් වැළකීම.** **(D) සත්ත්ව හිංසනයෙන් වැළකීම.**

**(E) බයිබලය එකම ආගමික ග්‍රන්ථය වීම.** **(F) දේව වන්දනාවට ප්‍රමුඛතාවය ලැබීම.**

(26) බෞද්ධ, හිංදු හා ක්‍රිස්තියානි යන ආගම් තුළ එන සමාන ඉගැන්වීම් අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) A , B හා C ය. (2) D , E හා F ය. (3) A , D හා F ය. (4) B , C හා E ය.

(27) බයිබලය යනු,

(1) ඉස්ලාම් දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි. (2) ක්‍රිස්තියානි දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.
(3) හිංදු දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි. (4) බමුණු දහම අන්තර්ගත ආගමික ග්‍රන්ථයයි.

(28) "අසල්වාසීන්ට ප්‍රේම කිරීම" යන උතුම් ඉගැන්වීම සමාජානුයෝජනය කරනුයේ,

(1) බුදු දහම තුළයි. (2) ඉස්ලාම් දහම තුළයි.
(3) ක්‍රිස්තියානි දහම තුළයි. (4) ජෛන දහම තුළයි.

(29) දිළිඳු බව අවමකර ගැනීමට හේතුවන ආගමික ඉගැන්වීමක් වන "පොහොසත් අය විසින් දිළිඳු අයට තමා සතු දෙයින් ප්‍රදානය කිරීම අනිවාර්ය අංගයකි." යන සංකල්පය හඳුන්වන්නේ,

(1) කාලිමාව යි. (2) සලාතය යි. (3) දානය යි. (4) සකාතය යි.

(30) ශ්‍රී ලාංකීය සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යන අංශයන් වෙනස්වීම කෙරෙහි හේතු සාධකයක් නොවන්නේ,

(1) විජයාගමනය යි. (2) මහින්දාගමනය යි.
(3) මැගලන් ලොව වටා ගමන් කිරීම යි. (4) බටහිර ආක්‍රමණ එල්ලවීම යි.

(31) දරුවෙකුට මව් කිරි දීමේදී අනුගමනය කරන ක්‍රියා පිලිවෙත ඔහුගේ කායික හා මානසික පෞරුෂ වර්ධනය කෙරෙහි පිටිවහල් වන බව පෙන්වා දෙනු ලැබූ මානව විද්‍යාඥයින් නම්,

(1) රැල්ෆ් ලින්ටන් හා මාග්‍රට් මීඩ් ය. (2) මාග්‍රට් මීඩ් හා රූත් බෙනඩික්ට් ය.
(3) රේමන්ඩ් ෆර්ත් හා රූත් බෙනඩික්ට් ය . (4) රැල්ෆ් ලින්ටන් හා රූත් බෙනඩික්ට් ය.

* පහත සඳහන් ස්ථානයන්හි පිහිටි ආගමික සිද්ධස්ථාන උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

**(A) ශ්‍රී මහා බෝධින් වහන්සේ හා රුවන්වැලිසෑය.** **(B) මහියංගනය හා කතරගම කිරිවෙහෙර.**

**(C) අම්බුළුවාව හා දළදා මාළිගාව.** **(D) කතරගම හා අම්බුළුවාව.**

(32) විවිධ ආගමික බැතිමතුන්ගේ ආගමික අවශ්‍යතා ඉටුකර ගැනීමට වඩාත් උචිතම සිද්ධස්ථාන පිහිටා ඇත්තේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(33) අපගාමී චර්යාවලින් තොර සමාජ පාලනය පිළිබඳ වඩාත් පුළුල් හා ගැඹුරු අර්ථ දැක්වීමක් ඉදිරිපත් කරන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?

(1) අග්ගඤ්ඤ සූත්‍රය. (2) කාලාම සූත්‍රය. (3) ව්‍යග්ගපජ්ජ සූත්‍රය. (4) මහා මංගල සූත්‍රය.

www.pirivena.lk

(34) වර්තමාන ශ්‍රී ලාංකීක සමාජය තුළ දන්සල් දීම, වෙසක් තොරණ ඉදිකිරීම, පහන් පූජා, භක්ති ගීත ආදී කාර්යයන් සුදහා විවිධ ආගමික බැතිමතුන් සහභාගි වන බව කැපී පෙනෙන ලක්‍ෂණයකි. මේ තුළින් නිරූපිත සමාජමය අගය නම්,

(1) ආගමික සහයෝගීතාව නිරූපිතය යි.

(2) ආගමික ගරුත්වය නිරූපිතය යි.

(3) අන්තර් ආගමික සබැඳියාව නිරූපිතය යි.

(4) බෞද්ධ ආගමික සංකල්පවලට අන්‍යාගමිකයින් ප්‍රිය කරන බව නිරූපිතය යි.

(35) ශ්‍රී ලාංකීය සමාජය තුළ බෞද්ධාගමික ප්‍රබෝධය හා සාමකාමී සහජීවනය ගොඩනැගීම කෙරෙහි ප්‍රබල සංසිද්ධියක් වූයේ,

(1) දුමින්දාගමනය යි. (2) මහින්දාගමනය යි. (3) විජයාගමනය යි. (4) ශාඛ්‍යසිංහාගමනය යි.

(36) ඇති - නැති, ඉහළ - පහළ සැම සහෝදරත්වයෙන් යුතුව එකට ජීවත් වීමෙන් දේව කරුණාව ලබන්නට සුදුසු බව ඉගැන්වෙන්නේ,

(1) හිංදු ආගම තුළයි. (2) ඉස්ලාම් ආගම තුළයි. (3) කිතුනු ආගම තුළයි. (4) බ්‍රාහ්මණ ආගම තුළයි.

* පහත සඳහන් ආගමික උත්සව උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

**(A) හජ්ජි උත්සවය.** **(B) දීපවාලී උත්සවය.**

**(C) රාමලාන් උත්සවය.** **(D) මහ සිකුරාදා.**

(37) ඉහත ' A ' හා ' C ' ආගමික උත්සව සැමරීම වඩාත් හරසරින් සිදු කරනුයේ,

(1) හිංදු ආගමිකයින් ය. (2) පරිබ්‍රාජක ආගමිකයින් ය. (3) කතෝලික ආගමිකයින් ය. (4) ඉස්ලාම් ආගමිකයින් ය.

(38) ගැටුමකින් තොරව සමාජ පාලනය ගෙන යැම උදෙසා දස පනත සම්මතයක් වශයෙන් අගය කරන ආගමික බැතිමතුන් නම්,

(1) කතෝලික ආගමිකයින් ය. (2) ශිව ආගමිකයින් ය.

(3) සුන්නි නිකායික ආගමිකයින් ය. (4) බ්‍රාහ්මණ ආගමිකයින් ය.

(39) ස්වභාවික විද්‍යා පර්යේෂණයන්හි නිරත වන පුද්ගලයාගේ පර්යේෂණාගාරය බවට පත්වන්නේ,

(1) සමාජය යි. (2) විද්‍යාගාරය යි. (3) ශල්‍යාගාරය යි. (4) කෞතුකාගාරය යි.

(40) මානව සමාජය අධ්‍යයනය කරන විෂයයන් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ජීව විද්‍යාව හා සමාජ විද්‍යාව. (2) මානව විද්‍යාව හා රසායන විද්‍යාව.

(3) භෞතික විද්‍යාව හා භූගර්භ විද්‍යාව. (4) සමාජ විද්‍යාව හා මානව විද්‍යාව.

* * *

www.pirivena.lk

# 2565 - මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2022

| 08 | S | I, II |
|---|---|---|

## (8) සමාජ විද්‍යාව - I, II

## සමාජ විද්‍යාව - II පත්‍රය

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්ද** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(1)

(i) නාගරීකරණය හේතුවෙන් සමාජය තුළ ඇති වූ ගැටළු **දෙකක් ලියන්න.**
(ii) මානව චර්යාවන් අධ්‍යයනය කරන චර්යාමය විද්‍යා විෂයයන් **දෙකක් නම් කරන්න.**
(iii) එමිල් ඩුර්කයිම්ගේ විග්‍රහයට අනුව සමාජ පරිණාමය සිදු වූ ප්‍රධාන ආකාරයන් **දෙක නම් කරන්න.**
(iv) හර්බට් ස්පෙන්සර්ට අනුව රණකාමී සමාජයේ පැවති ලක්ෂණ **දෙකක් ලියන්න.**
(v) නැකත, කයිය යන මේවායේ අර්ථය ලියන්න.
(vi) සංස්කෘතියේ ප්‍රධාන අංශයන් **දෙක නම් කරන්න.**
(vii) ලාංකේය සමාජයේ ඔබ හඳුනාගත් ප්‍රධාන සංස්කෘතීන් **දෙකක් නම් කරන්න.**
(viii) ශ්‍රී ලංකාව ආක්‍රමණයට පැමිණි බටහිර ජාතීන් කණ්ඩායම් **දෙකක් නම් කරන්න.**
(ix) පරිපූර්ණ අධ්‍යාපනයක් තුළින් බිහි කරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක් නම් කරන්න.**
(x) නාගරික ජන සමාජය තුළ ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක **දෙකක් නම් කරන්න.**

(ලකුණු 02 × 10 = 20)

(2)

(i) ඔබ අධ්‍යනය කරන සමාජීය විද්‍යා හා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)
(ii) සමාජ විද්‍යාව බිහිවීම කෙරෙහි බලපෑම් කළ ප්‍රබල සාධක **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)
(iii) සමාජ අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යායුතු ආකාරය සිඟාලෝවාද සූත්‍රයේ සාධක **දෙකක් ඇසුරින් පැහැදිළි කරන්න.** (ලකුණු 05 යි)

(3)

(i) සමාජ ගතික බව පිළිබඳ අවධානය යොමුකළ මුල් කාලීන සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකු නම් කරන්න.** (ලකුණු 02 යි)
(ii) "යථානුභූත අවධියේ" සමාජයේ පැවති ලක්ෂණයන් **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)
(iii) සමාජ විද්‍යාවේදී අධ්‍යනය කරන 'කයිය' හා 'පංගුව' යන සංකල්ප දෙකෙහි ඇති සමාජ විද්‍යාත්මක වැදගත්කම කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 05 යි)

(4)

(i) කාල් මාක්ස් පෙන්වා දුන් 'ධනවාදී' සමාජ අවධියේ සමාජය තුළ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණ **දෙකක් ලියන්න.** (ලකුණු 02 යි)
(ii) නවීකරණයට බඳුන්වන සමාජයක් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **තුනක් ලියන්න.** (ලකුණු 03 යි)
(iii) නාගරික සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රබල ලක්ෂණ **දෙකක් පිළිබඳ විමසීමක් කරන්න.** (ලකුණු 05 යි)

www.pirivena.lk

[7 වැනි පිටුව බලන්න.

(5)

(i) ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන උප සංස්කෘතීන් **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) භෞතික සංස්කෘතිය තුළ දක්නට ලැබෙන අංගයන් සඳහා නිදසුන් **තුනක් සපයන්න.** (ලකුණු 03 යි)

(iii) ඉස්ලාම් ආගමිකයින් විසින් අනුගමනය කරන 'සකාතය' යන සංකල්පයේ ඇති වැදගත්කම ක්ෂේත්‍ර **දෙකක් ඔස්සේ විවරණය කරන්න.** (ලකුණු 05 යි)

(6)

(i) ආරෝපිත දිශානතිකය සඳහා නිදසුන් **දෙකක් සපයන්න.** (ලකුණු 02 යි)

(ii) බහුවිධ සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **තුනක් සඳහන් කරන්න.** (ලකුණු 03 යි)

(iii) 'අගහස්දානය', 'කුරුළු පාලුව' යන සංකල්පවල ඇති සමාජ විද්‍යාත්මක වැදගත්කම විමසීමට ලක් කරන්න. (ලකුණු 05 යි)

(7)

(i) සමාජ පාලනය පිළිබඳව තොරතුරු අන්තර්ගත බෞද්ධ සූත්‍ර **දෙකක් නම් කරන්න.** (ලකුණු 02 යි)

(ii) සමාජ පාලනයේදී යොදාගත හැකි විධිමත් පාලන ආයතන **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) ස්වයං පාලනක් ගොඩනගා ගැනීමේදී වැදගත් වන බුදුදහමේ එන ඉගැන්වීම් ක්ෂේත්‍ර **දෙකක් ඔස්සේ විස්තර කරන්න.** . (ලකුණු 05 යි)

(8)

(i) පුද්ගලයා සමාජගත කරන ආයතනයන් **දෙකක් නම් කරන්න**. (ලකුණු 02 යි)

(ii) සමාජය අධ්‍යනය කරන පුද්ගලයාට සමාජය තුළ දක්නට ලැබෙන ප්‍රබල සමාජ සමූහ **තුනක් නම් කරන්න.** (ලකුණු 03 යි)

(iii) සමාජ අපගාමී චර්යා අවම කිරීම සඳහා භික්ෂූන් වහන්සේ විසින් අනුගමනය කළ හැකි ක්ෂේත්‍ර **දෙකක් පිළිබඳව විමසීමක් කරන්න.** (ලකුණු 05 යි)

* * *

www.pirivena.lk